# සටහන

2016 සැප් - ඔක්
9 - 10 කලාපය

2 පිලිපීනයේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්
3 ස්ථායීතාව සහ ශක්තිමත්භාවය සඳහා වූ රාජ්‍ය මූල්‍ය අවකාශය
6 ශ්‍රී ලංකාව ම ආවරණය වන පරිදි ජාතික පාරිභෝගික මිල දර්ශකයක්
8 බැංකුවල සයිබර් අවදානම් කළමනාකරණය
11 මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම
14 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව, ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා

රු. 20/-

ISSN 1391-3697
16910
9 770041 001212

ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව



# පිලිපීනය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...






බටහිර ශාන්තිකර සාගරයේ පිහිටි අග්නිදිග ආසියාතික රටක් වන පිලිපීනය ඒකීය ස්වෛරී දූපත් රාජයයක්. දූපත් 7,641කින් පමණ සමන්විත වන එහි නිල නාමය වන්නේ පිලිපීන ජනරජය යනුයි. බටහිරින් දකුණු චීන මුහුදෙන් ද, නැගෙනහිරින් පිලිපීන මුහුදෙන් ද, නිරිත දෙසින් සෙලිබිස් මුහුදෙන් ද සීමා වී ඇති පිලිපීනයේ වර්තමාන අගනුවර වන්නේ මැනිලා නගරයයි.

වර්ෂ 1521 දී ෆර්ඩිනන්ඩ් මැගලන්ගේ දේශ ගවේෂණ කටයුතුවලින් පසුව ජනාවාස වීම ඇරඹුණු මේ දිවයින් සමූහය වෙත 1543 දී පැමිණි ස්පාඤ්ඤ ජාතික දේශ ගවේෂක ලෝපෙස් ද විලාලෝබොස් විසින් ස්පාඤ්ඤයේ II වන පිලිප් රජතුමාට ගෞරව පිණිස "ෆිලිපිනාස්" යන නම තැබුවා. ඉන් පසු වසර 300ක් පමණ ස්පාඤ්ඤ යටත් විජිතයක් ව පැවති පිලිපීනයේ කතෝලික දහම පැතිර යෑමට එය ද හේතුවක්. 19 වන සියවසේ අග භාගයේ ආරම්භ වූ පිලිපීන-ඇමරිකානු යුද්ධය දිගු කලක් පැවතුන ද II වන ලෝක යුද්ධයෙන් පසු ව එයට නිදහස ලැබුණා. ආසියානු සංවර්ධන බැංකුවේ මූලස්ථානය පිලිපීනයේ පිහිටා ඇති අතර, එක්සත් ජාතීන්, ලෝක වෙළෙඳ සංවිධානය, ආසියාන් සංවිධානය වැනි අන්තර්ජාතික සංවිධාන කිහිපයක ම පුරෝගාමී සාමාජිකයෙක්. ජනගහනය වැඩි ම රටවල් අතරින් ලොව 12 වැනි තැන ගන්නා පිලිපීනය අග්නිදිග ආසියාවේ ප්‍රධාන ක්‍රිස්තියානි රටවල් දෙකෙන් එකක්. අනෙක් රට වන්නේ නැගෙනහිර ටිමෝරයයි. විවිධ ක්ෂේත්‍රයන්ගෙන් විශිෂ්ඨ සේවාවක් කළ ආසියාතිකයන් වෙත පිරිනැමෙන "මැග්සේසේ" සම්මානය පිලිපීනයේ 7 වන ජනාධිපතිවරයා වූ රැමොන් මැග්සේසේ (ජෝෂ්ඨ) මහතා සිහිකරමින් ප්‍රදානය කෙරෙන්නක් ■

මූලාශ්‍ර - World Fact Book
Wikipedia විශ්වකෝෂය

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය<br>ගොඩ බිම් ප්‍රමාණය<br>අභ්‍යන්තර ජලාශ | <br>වර්ග කි.මී. 300,000<br>වර්ග කි.මී. 298,170<br>වර්ග කි.මී. 1,830 |
| ජනගහනය (2017 ජූලි ඇස්තමේන්තු) | 104,256,076 |
| ජනගහන වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 1.57% |
| උපත් අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට උපත්) | 23.7 |
| මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (ජනගහනය දහසකට මරණ) | 6.1 |
| උපතේදී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2017 ඇස්තමේන්තු) | 69.4 |
| ළදරු මරණ අනුපාතය (2017 ඇස්තමේන්තු) (සජීවී උපත් දහසකට මරණ) | 21.4 |
| දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 874.5 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය (2017 ඇස්තමේන්තු) | 6.6% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 8,200 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු) | |
| කෘෂිකර්මය | 9.4% |
| කර්මාන්ත | 30.8% |
| සේවා | 59.8% |
| ශ්‍රම බලකාය (2016 ඇස්තමේන්තු) | මිලියන 44.46 |
| සේවා වියුක්තිය (2017 ඇස්තමේන්තු) | 6% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2015 ඇස්තමේන්තු) | 44.4 |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2017 ඇස්තමේන්තු) | -2.7% |
| උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු) | 3.1% |
| අපනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 53.22 |
| අපනයන භාණ්ඩ | අර්ධ සන්නායක සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන, යන්ත්‍ර සහ ප්‍රවාහන උපකරණ, රසායනික ද්‍රව්‍ය, සකස් කළ ආහාර පාන, ඇඟළුම්, පොල්තෙල්, මුහුදු ආහාර, කෙසෙල් ඇතුළු පළතුරු |
| ආනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 90.42 |
| ආනයන භාණ්ඩ | ඉලෙක්ට්‍රොනික උපකරණ, ඛනිජ තෙල්, යන්ත්‍ර සූත්‍ර, යකඩ සහ වානේ, රෙදිපිළි, ධාන්‍ය වර්ග, ප්ලාස්ටික් |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

සටහන

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් "සටහන" තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 480.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ

# ස්ථායිතාව සහ ශක්තිමත්භාවය සඳහා වූ රාජ්‍ය මූල්‍ය අවකාශය

සාර්ව ආර්ථික ස්ථායිතාව සඳහා සහ කම්පනයන්ට මුහුණ දීමට ආර්ථිකය සතු හැකියාව වර්ධනය කිරීමට සහයෝගය දැක්වීම අරමුණු කර ගනිමින් රාජ්‍ය මූල්‍ය අවකාශ නිර්මාණය කිරීම පිළිබඳව විශේෂයෙන් ම, මූල්‍ය අර්බුදයෙන් පසු ව ගෝලීය රාජ්‍ය මූල්‍ය බලධාරීන්ගේ අවධානය යොමු වී ඇත. අවිනිශ්චිත ගෝලීය ප්‍රවණතා, ඉහළ යන ණය සේවාකරණ වගකීම් සහ ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තිය තුළින් ඇති වන පීඩනයන්, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතුවල තිරසරභාවය කෙරෙහි අඛණ්ඩ ව අභියෝග ඇති කරන අතර, දියුණු සහ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකවල පවතින සංරෝධිත රාජ්‍ය මූල්‍ය වාතාවරණය හමුවේ රාජ්‍ය අයවැය තුළ රාජ්‍ය මූල්‍ය අවකාශයක් සඳහා ඇති අවශ්‍යතාව වැඩිදියුණු කරයි. රජයේ අනාගත රාජ්‍ය මූල්‍ය තත්ත්වය මත අනිසි පීඩනයක් ඇති නො කොට, ශීඝ්‍ර සංවර්ධනයක් ලබා ගැනීමේ අවශ්‍යතාව, ශ්‍රී ලංකාව වැනි නැගී එන මැදි ආදායම්ලාභී රටවල අයවැය ක්‍රියාවලිය සඳහා බලපෑම් ඇති කර තිබේ. මෙය ශ්‍රී ලංකාව තුළ ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය අවකාශයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කරයි.

හෙලර් (2005) විසින් රාජ්‍ය මූල්‍ය අවකාශය යනු “රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ තිරසරභාවයට හෝ ආර්ථික ස්ථායිතාවට හානියක් නොවන පරිදි, රජයට තම සම්පත් අපේක්ෂිත අවශ්‍යතා සඳහා ලබාබ දීමට අයවැය තුළ පවතින ඉඩකඩ” වශයෙන් අර්ථ දක්වා ඇත[1]. එ නම් රටෙහි සාර්ව ආර්ථික ස්ථායිතාවට හානි නො වන පරිදි වියදම්, ආදායම් හෝ ණය ලබා ගැනීමේ විකල්ප පිළිබඳ තීරණ ගැනීමේ දී රජයට නම්‍යශීලී ලෙස තම අමතර සම්පත් උපයෝජනය සඳහා පවතින අවස්ථාව රාජ්‍ය මූල්‍ය අවකාශය වේ. රාජ්‍ය වියදම් සංයුතිය සහ ප්‍රවණතාව, බදු නැමියාව, ණය ලබා ගැනීමේ නැමියාව මෙන් ම ආර්ථික වර්ධනය රාජ්‍ය මූල්‍ය අවකාශයේ ප්‍රධාන නිර්ණායකවලට ඇතුළත් වේ. එම නිසා ආදායම ඉහළ නැංවීම, වියදම් සීමා කිරීම හෝ දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ණය ලබා ගැනීම අවම කිරීම සහ ආර්ථික වර්ධනය වේගවත් කිරීම මගින් රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කළ හැකි වේ. රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීමේ දී, රාජ්‍ය මූල්‍ය වාතාවරණයේ තිරසරබව කිසිසේත් කැප කළ යුතු නොවේ. එහි දී වියදම් වැඩසටහන් සඳහා සහ ණය සේවාකරණය සඳහා අවශ්‍ය කෙටිකාලීන සහ දිගුකාලීන මූල්‍ය ශක්‍යතාව පවතින බවට රජය සහතික කළ යුතු ය.

### ශ්‍රී ලංකා රාජ්‍ය අයවැයෙහි ව්‍යුහය

සීමිත සම්පත් සහිත පරිසරයක් තුළ වියදම් තරගකාරී ව වර්ධනය වීම මෑත අතීතයේ ශ්‍රී ලංකාවේ අයවැය ක්‍රියාවලියෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් විය. ආදායම් ලැබීම් අඩුවීම සහ රාජ්‍ය මූල්‍ය තත්ත්වය හමුවේ ඉහළ වියදම් අවශ්‍යතාවල ප්‍රතිඵලයක් ලෙස සෑම රජයක් ම නිරන්තරයෙන් සාපේක්ෂ වශයෙන් ඉහළ අයවැය හිඟයක් වාර්තා කළේ ය. 2010 - 2015 කාලපරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවේ අයවැය හිඟයෙහි සාමාන්‍යය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් පමණ විය. රජයෙහි ආදායම් හා වියදම් ව්‍යුහය විමර්ශනය කිරීමේ දී, රාජ්‍ය මූල්‍ය අධිකාරීන් මුහුණ දෙන අභියෝග හඳුනා ගත හැකි ය. 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය වියදම්හි සාමාන්‍යය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 18.8 ක මට්ටමේ පවත්වා ගැනුණි. මෙම කාල සීමාව තුළ රජයේ වර්තන වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13.7ක සීමාවෙහි පැවතුණ ද වර්තන වියදම් තුළ අයවැයෙහි නො වැළැක්විය හැකි වියදම් සංරචකයක් වන පොලී ගෙවීම් සහ වැටුප් හා දීමනා සඳහා වූ වියදම්, පුනරාවර්තන වියදමෙන් තුනෙන් දෙකකට වඩා ආයකත්වයක් සපයමින් නො වෙනස් ව පැවතුණි. 2010 - 2015 කාල


1 Heller, P. (2005) 'Understanding Fiscal Space', Policy Discussion Paper PDP/05/4, Washington, DC : Fiscal Affairs Department, IMF

සීමාව තුළ දී වැටුප් හා වේතන සහ පොලී ගෙවීම්වල සාමාන්‍යය, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 4.4ක් සහ සියයට 4.7ක් විය. තව ද, මෙම කාල සීමාව තුළ දී අයවැයෙහි ඇතුළත් දිළිඳුකම අවම කිරීමෙහි ප්‍රධාන සංරචකයක් වන කුටුම්බ සඳහා ලබාදෙන සංක්‍රාම ද අයත් වන, සුබසාධන වියදම් සහ සංක්‍රාම ගෙවීම්හි සාමාන්‍යය ද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.0ක් විය.

මෙම පසුබිම තුළ, අනෙකුත් අත්‍යවශ්‍ය මූල්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සැපයීමට, පවත්නා අයවැය තුළ ඇති ඉඩකඩ සීමා සහිත වේ. රජය විසින් ප්‍රමුඛ අංශ වන වැනි අංශ සඳහා කරනු ලබන වියදම් ඉහළ දැමීම මගින් දිගු කාලීන ව මානව ප්‍රාග්ධනය සඳහා ඉහළ ප්‍රතිලාභ අත් කර දෙන බවට තර්කයක් ගොඩ නැගිය හැකි ය. කෙසේ වෙතත්, අයවැයෙහි වියදම් යම් අන්දමකට රජයට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට අවම හැකියාවක් ඇති වත්මන් වියදම් ව්‍යුහය සැලකීමේ දී මෙම අරමුණු සඳහා වන අරමුදල් ඉහළ නැංවීම සඳහා රජය විසින් රාජ්‍ය මූල්‍ය අවකාශයක් නිර්මාණය කිරීම අවශ්‍ය ව තිබේ.

ආදායම් පාර්ශ්වය සැලකීමේ දී රජයේ මුළු ආදායම් ලැබීම්, සමස්ත වියදමට වඩා සැලකිය යුතු ලෙස

## ආදායම් සහ වියදම්වල ක්‍රියාකාරිත්වය




අධ්‍යාපන සහ සෞඛ්‍ය වැනි අංශ සඳහා අවශ්‍ය වියදම් දැරීමේ දී රාජ්‍ය මූල්‍ය බලධාරීන් මෙම ගැටලුවට මුහුණපාන අයුරු පැහැදිලි ව නිරීක්ෂණය කළ හැකි ය. කාර්යයන් මත පදනම් ව වියදම් අධ්‍යයනය කිරීමේ දී සෞඛ්‍ය සහ අධ්‍යාපන වැනි අංශ සඳහා අයවැයෙන් වෙන් කරන ලද අරමුදල්වල සාමාන්‍යය, සමස්ත අයවැයෙහි වියදමින් සියයට 16ක් පමණ වන අතර, 2015 වසරේ වර්ධනයක් පෙන්නුම් කළ ද 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස අධ්‍යාපන සහ සෞඛ්‍යය සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණය, පිළිවෙළින්, සියයට 1.7ක් සහ සියයට 1.3ක් විය. සෞඛ්‍ය සහ අධ්‍යාපන පහළ අගයක පවතින අතර, එය පුනරාවර්තන වියදම පියවා ගැනීමට ද ප්‍රමාණවත් නො වේ. 2010 - 2015 කාලපරිච්ඡේදය තුළ දී දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස ආදායමෙහි සාමාන්‍යය සියයට 12.4ක් විය. ප්‍රධාන වශයෙන් ම රටෙහි පවතින දුර්වල බදු රැස් කිරීමේ ක්‍රියාවලිය, ආදායම පහළ මට්ටමක පැවැතීමට හේතු වී තිබේ. 2015 වසරේ දී එක් වරක් පමණක් ගෙවිය යුතු බදු කිහිපයක් පැනවීම ද හේතුවෙන් බදු ආදායම, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.1 දක්වා ඉහළ ගිය ද 2014 වසරේ දී එය සියයට 10.1 දක්වා පහළ ගියේ ය. කලාපීය රටවල් හා සැසඳීමේ

දී ශ්‍රී ලංකාවේ බදු එකතු කිරීම අඛණ්ඩ ව දුර්වල මට්ටමක පවතී. විවිධ බදු නිදහස් කිරීම් හේතුවෙන් බදු පද්ධතියේ නම්‍යතාව අඩු වීම, බදු පැහැර හැරීම් සහ දුර්වල බදු පරිපාලනය යන කරුණු ආදායම් එක් රැස් කිරීමෙහි දුර්වල කාර්ය සාධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

ඉහළ වියදම් මට්ටම සමඟ පහළ මට්ටමක පවතින ආදායම් ජනනය වීම හේතුවෙන් දැනට ඇති ඉහළ අයවැය හිඟයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ රාජ්‍ය ණය මට්ටමක් නිර්මාණය වී තිබේ. 2015 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ණය සියයට 76 දක්වා ඉහළ ගොස් ඇත. මේ තුළින්, ණය සේවාකරණ ගෙවීම් ඉහළ නංවන අතර, රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පීඩනයක් ඇති කර තිබේ. වර්තමානයේ දී, බදු සහ බදු නො වන ප්‍රභව හරහා උපයනු ලැබූ ආදායමෙන් සියයට 90ක් පමණ ණය සේවාකරණ ගෙවීම් සඳහා යොදවනු ලැබේ. මේ අතර, උද්ධමනාත්මක නො වන දේශීය මූලාශ්‍ර ඔස්සේ ණය ලබා ගැනීමට ඇති ඉඩප්‍රස්ථා සීමා වී ඇති අතර විදේශ මූලාශ්‍ර මගින් ලබා ගන්නා ණය මට්ටම ඉහළ ගියහොත් රට බාහිර කම්පනයන්ට භාජනය වීමට ඇති අවදානම ද ඉහළ යනු ඇත. රාජ්‍ය මූල්‍ය අවකාශයක් නොමැති වීම තුළින් ආර්ථිකයේ වර්ධනය වන සම්පත් අවශ්‍යතා සපුරාලීම සඳහා ණය ගැනීම ඉහළ දැමීමට රජයට නො හැකි වී ඇති බව පිළිබිඹු වේ.

## ඉදිරි දැක්ම

රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සඳහා අවකාශය අවම වීම හේතුවෙන් සමාජයේ විවිධ අංශ වෙතින් සම්පත් සඳහා ඇති වන නව ඉල්ලුම් තත්ත්ව රජයේ අයවැය තුළින් සපුරාලීම ඉතා අපහසු කාර්යයක් වේ. රජයට අමතර ණය ලබා ගැනීමට ඇති හැකියාව අවම වීම හේතුවෙන්, බදු සහ වියදම් ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීම කළ යුතු වේ. රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කිරීම සඳහා පවතින අයවැය ව්‍යුහය විශාල ලෙස ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ. අවම වශයෙන් ශ්‍රී ලංකාවේ කලාපීය රටවල් හා සමගාමී ව ආදායම් ජනනය කිරීම වර්ධනය කිරීම හරහා දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ඉලක්කගත කළ යුතු වේ. බදු පදනම ප්‍රසාරණය කිරීම සහ බදු අනුකූලතාව ඉහළ නැංවීම අරමුණු කර ගෙන බදු ප්‍රතිංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වේ. වියදම් පාර්ශ්වය සැලකීමේ දී, රජයේ වියදම් ප්‍රමුඛතා පිළිබඳ පුළුල් දර්ශනයක් සහිත මැදි කාලීන වියදම් රාමුවකට අනුරූප ව, රාජ්‍ය මූල්‍ය අවකාශය නිර්මාණය කළ යුතු වේ. එ සේ ම, රටෙහි වියදම් සඳහා මූල්‍යමය වටිනාකමක් ලබා දීමට හැකි වන පරිදි වියදම් කළමනාකරණයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම කළ යුතු ය. මෙම තත්ත්වය තුළ එක් එක් වියදම් අයිතම, ආර්ථික, දේශපාලනික, සමාජීය සහ රජයේ වෙනත් සැලකිය යුතු කරුණුවලට අනුරූප ව ක්‍රමානුකූල ව විමර්ශනය කළ යුතු ය. තව ද, විධිමත් ව සකසන ලද අයවැයට අමතර ව පසු ව ගනු ලබන වියදම් පිළිබඳ තීරණ හරහා රාජ්‍ය මූල්‍ය අවකාශය අවම වන හෙයින් එ වැනි තීරණ ගැනීම සීමා කළ යුතු ය. රජය සතු ව්‍යවසායන්වල මූල්‍ය ශක්තිය වර්ධනය කිරීමෙන් සහ එම ආයතන අයවැය මත රඳා පැවැත්ම අවම කිරීම හරහා රාජ්‍ය ව්‍යවසායවල කාර්යසාධනය වැඩිදියුණු කිරීමට රජය විසින් කටයුතු කළ යුතු ය. ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කළ යුතු වේ. රජය විසින් කම්කරු සංවිධාන හා පොදු ජනතාව ඇතුළු සියලු පාර්ශ්ව සමඟ ක්‍රමවත් සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ සඳහා ඇති විය හැකි විරෝධතා අවම කර ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය වේ.

(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)

# ශ්‍රී ලංකාව ම ආවරණය වන පරිදි ජාතික පාරිභෝගික මිල දර්ශකයක්

ශ්‍රී ලංකාවේ නිල පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීමේ කාර්යභාරය පැවරී ඇති ආයතන වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 නොවැම්බර් මස 23 දින නව ජාතික පාරිභෝගික මිල දර්ශකයක් ප්‍රකාශයට පත් කරන ලදී.


ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙන් අනාවරණය වූ පරිදි, පරිභෝජන හා වියදම් රටාවන්හි මෑත කාලීන වෙනස්කම් ජාතික පාරිභෝගික මිල දර්ශකය මගින් වඩා හොඳින් පිළිබිඹු වේ. පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීමේ දී ජාත්‍යන්තර ව පිළිගත් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සිදු කර ඇත. වඩා පුළුල් ජාතික ආවරණයක් සහිත ජාතික පාරිභෝගික මිල දර්ශකය ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල විචලනයන් මැනීම සඳහා ප්‍රථමයෙන් ම ගණනය කරන ලද කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ ආවරණයට ඉදිරියෙන් තැබූ පියවරක් ලෙස සැලකිය හැකි ය. මෙ තෙක් සකසන ලද කොළඹ පාරිභෝගික මිල දර්ශකවල භූගෝලීය ආවරණය, කොළඹ පාරිභෝගික මිල දර්ශක (1952=100) සඳහා කොළඹ නගරයට සීමා වූ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශක (2002=100) හා කොළඹ පාරිභෝගික මිල දර්ශක (2006/07=100) සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික කලාප ආවරණය කෙරිණි.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ හා කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ විචලනයන් 1 වන රූප සටහනෙහි ඉදිරිපත් කර ඇත. ජාතික පාරිභෝගික මිල හා කොළඹ පාරිභෝගික මිල දර්ශකයන්හි ප්‍රධාන කරුණු පිළිබඳ සංසන්දනයක් 1 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

දිවයිනේ පළාත් නවයෙහි ම ගෘහ ඒකකවල පරිභෝජන රටා පිළිබිඹු වන පරිදි පාරිභෝගික මිල ගණන් පිළිබඳ දත්ත පැවතීම, ආර්ථිකයේ මිල ප්‍රවණතා හා මිල විචලනයන් පිළිබඳ පුළුල් දැක්මක් සපයයි. ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම හේතුවෙන්, ප්‍රතිපත්ති තීරකයන් හට මිල ස්ථායීතාව හා අනෙකුත් සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ වඩා දැනුම්වත් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා අවස්ථාව සලසයි.

1 වන රූප සටහන

**ජ.පා.මි.ද සහ කො.පා.මි.ද විචලනයන්**



1 වන රූප සටහන

**ජා.පා.මි. හා කො.පා.මි. දර්ශකයන්හි ප්‍රධාන කරුණු පිළිබඳ සැසඳීම**

| අංශය | ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) | කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) |
|---|---|---|
| ආවරණය වන භූගෝලීය කලාප සහ ඉලක්කගත ජනගහණය | ශ්‍රී ලංකාවේ සෑම පළාතක ම සියලු ගෘහ ඒකක ආවරණය කෙරේ. | කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික කලාපවල සියලු ගෘහ ඒකක ආවරණය කෙරේ. |
| පදනම් සමීක්ෂණය | 2012/13 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය<br>2012 ජූලි මස සිට 2013 ජුනි මස දක්වා මාස 12ක කාල සීමාව තුළ දී සමීක්ෂණය සිදු කෙරිණි.<br>පරිභෝජන රටාවන්හි සෘතුමය විචලනයන් හසු කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් සමීක්ෂණ කාල සීමාව සඳහා සම්පූර්ණ වසරක් ආවරණය කෙරේ. | 2006/07 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය<br>2006 ජූලි සිට 2007 ජුනි දක්වා වූ මාස 12ක කාල සීමාව තුළ දී සමීක්ෂණය සිදු කෙරිණි. |
| දර්ශකයේ පදනම් කාල සීමාව | 2013 | 2006/07 |
| පදනම් කාල සීමාව තුළ දී මුළු පරිභෝජන වියදම | ජා.පා.මි. දර්ශකයේ භාණ්ඩ හා සේවා පැස සඳහා මුළු මාසික පරිභෝජන වියදම රු. 32,142.69<br>එක් දර්ශක අංකයක අගය රු. 321.43 (රු. 32,142.69/100 = රු. 321.43)<br>මෙම වියදම් මට්ටම, කොළඹ පාරිභෝගික මිල දර්ශක සඳහා 2006/07 පදනම් කාල පරිච්ඡේදයේ දී වාර්තා වූ අගයට වඩා සියයට 14.9ක් වැඩි ය.<br>මෙම ඉහළ යාම මගින් සළකනු ලබන කාල සීමාවේ වෙනස, භූගෝලීය ආවරණ කලාප අතර වෙනස, ආදායම් ඉහළ යෑම, මිල ගණන්හි වෙනස්කම් සහ එක් එක් පළාතේ භාණ්ඩ පැසෙහි සංයුතියෙහි ඇති වෙනස්කම් පිළිබිඹු කරයි. | කොළඹ පාරිභෝගික මිල දර්ශක භාණ්ඩ හා සේවා පැසෙහි මුළු මාසික පරිභෝජන වියදම රු. 27,972.11කි.<br>එ බැවින් එක් දර්ශක අංකයක අගය රු. 279.72 |
| භාණ්ඩ පැසෙහි අයිතම ගණන | ප්‍රධාන කාණ්ඩ 12ක් යටතේ අයිතම 407ක් අන්තර්ගත වේ.<br>මත්පැන් හා දුම්කොළ කාණ්ඩය ඇතුළත් වේ.<br>කොළඹ පාරිභෝගික මිල දර්ශකහි ආපනශාලා සහ හෝටල් කාණ්ඩය, ආහාර කාණ්ඩය යටතේ තිබුණු අතර, ජා.පා.මි. දර්ශකයෙහි එය වෙන ම කාණ්ඩයක් ලෙස ඇතුළත් කර තිබේ. | ප්‍රධාන කාණ්ඩ 10ක් යටතේ අයිතම 373ක් අන්තර්ගත වේ. |
| බර තැබුම් ව්‍යුහය | ආහාර සඳහා වියදම් කොටස, මුළු පරිභෝජන වියදමෙන් සියයට 44.04කි. | ආහාර සඳහා වියදම් කොටස, මුළු පරිභෝජන වියදමෙන් සියයට 41.03කි. |
| ගණනය කිරීමේ පිළිවෙළ | දිගුකාලීන ව සිදු වන, නියැදි වෙනස්කම් හා ප්‍රමිති සංශෝධනවල දී වඩා භාවිතයට පහසු නම්‍යශීලී වැඩිදියුණු කරන ලද පියවර දෙකකින් යුත් ලැස්පියර්ගේ සූත්‍රය භාවිත වේ. | ලැස්පියර්ගේ දර්ශක සූත්‍රය භාවිත වේ. |
| මිල රැස් කිරීම | එක් අයිතමයක් සඳහා දිවයින පුරා එක් දිස්ත්‍රික්කයක ප්‍රධාන නගරයෙහි මිල ගණන් රැස් කිරීමේ මධ්‍යස්ථාන 3 බැගින් යොදා ගැනීම | කොළඹ නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි මිල ගණන් රැස්කිරීමේ මධ්‍යස්ථාන 14ක් යොදා ගැණිනි. |

(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)

# බැංකුවල සයිබර් අවදානම් කළමනාකරණය

## 1. හැඳින්වීම

විසි වන ශතවර්ෂයේ අග භාගයේ දී, ස්වයංක්‍රියකරණය තුළින් කාර්යක්ෂමතාව ඉහළ දැමීම අරමුණු කර ගනිමින්, බැංකු විසින් තොරතුරු තාක්ෂණය බහුල ව භාවිත කිරීමට පෙළඹී ඇත. අන්තර්ජාල සහ සයිබර් තාක්ෂණයන් ඉස්මතු වීම හේතුවෙන් බැංකු සේවා ගනුදෙනුකරුවන් වෙත සමීප කිරීම පහසු වී ඇති අතර, එය බැංකුවල මෙහෙයුම් කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නැංවීමට රුකුලක් විය. මෙ ලෙස බැංකු සේවාවන් සැපයීම පිණිස තොරතුරු තාක්ෂණය සහ සයිබර් අවකාශය බහුල ලෙස භාවිත කිරීම හේතුවෙන් සහ ඒවායේ බිඳ වැටීම් නිසා ඇති විය හැකි අහිතකර තත්ත්වයන් මග හරවා ගැනීම වෙනුවෙන් සයිබර් අවදානම් විශේෂයෙන් හඳුනා ගැනීමේ සහ කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව ඇති විය.

## 2. බැංකු ක්ෂේත්‍රය තුළ තාක්‍ෂණය යොදා ගැනීම

බැංකු ක්ෂේත්‍රය තුළ තාක්ෂණය භාවිතයට ගත් ප්‍රධාන අවස්ථා කිහිපයක් පහත දක්වා ඇත.

- පරිගණකගත ගනුදෙනු සැකසුම් කිරීම හඳුන්වා දීම තුළින් ලෙජර් පොත්වල ලිඛිත ව පවත්වා ගෙන යනු ලැබූ ගනුදෙනු පරිගණකගත පද්ධතිවලට ගෙන යාම
- ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතය
- මධ්‍යගත බැංකු පද්ධති භාවිතය තුළින්, සියලු පාරිභෝගික ගනුදෙනු සැකසීම සහ දෛනික ශේෂයන් මූල්‍ය ගිණුම්වලට ඇතුළත් කිරීම
- තොරතුරු හුවමාරු මධ්‍යස්ථාන පිහිටුවීම තුළින් බැංකු සහ අනෙකුත් ණය දෙන ආයතනවලට විභව ණයගැතියන්ගේ ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා ගැනීමට හැකිවීම
- අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පද්ධති හා ඉලෙක්ට්‍රොනික ගෙවීම් ක්‍රමවේද බිහිවීම හරහා අතථ්‍ය බැංකුකරණය (Virtual Banking) ඇතිවීම

## 3. සයිබර් අවදානම් යනු මොනවාද?

සයිබර් අවදානම් යනු තොරතුරු තාක්ෂණ පද්ධතිවල බිඳ වැටීමක ප්‍රතිඵලයක් ලෙස සිදු වන මූල්‍යමය අලාභ, මෙහෙයුම් කටයුතුවලට සිදු වන බාධා හෝ ව්‍යාපාරික කීර්තියට සිදුවන හානි ලෙස අර්ථ දැක්විය හැකි ය. තව ද, සයිබර් අවදානම් යනු අන්තර්ජාල ක්‍රියාකාරකම්, ඉලෙක්ට්‍රොනික පද්ධති, සන්නිවේදන ජාල සහ ඉලෙක්ට්‍රොනික ලෙස පුද්ගල දත්ත ගබඩාකරණය හා සම්බන්ධිත අවදානම් ලෙස ද හැඳින්විය හැකි ය.

## 4. ප්‍රධාන සයිබර් තර්ජන වර්ග

- හැකින්/බලාත්ප්‍රවේශ ප්‍රහාර

  බලාත්ප්‍රවේශ ප්‍රහාරයක දී, එය ක්‍රියාකරවන්නන් විසින් ආරක්ෂිත පද්ධති/ජාලවලට ඇතුළු වී දත්ත විනාශ කිරීම, විකෘති කිරීම හෝ සොරකම් කිරීම හෝ පාලනයට නතු කර ගත් පද්ධතියක් තුළින් අනවසර ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සිදු විය හැක.

- බෙදාහරින ලද සේවා ප්‍රතික්ෂේපන ප්‍රහාර (DDoS)

  මෙහි දී ඉලක්කගත පද්ධතියක් වෙත ඉල්ලීම් ප්‍රවාහයන් යොමු කිරීම මගින් පද්ධතිය බිඳ දමා එහි නීත්‍යානුකූල පරිශීලකයන්ට පද්ධතියට පිවිසීම අහිමි කෙරේ.

- අහිතකර මෘදුකාංග (Malware)

  මෙ වැනි ප්‍රහාරයක දී, අහිතකර මෘදුකාංග භාවිත කර ඉලක්කගත පද්ධතියක් පාලනයට නතු කර

ගැනීම හෝ එහි ක්‍රියාකාරිත්වය අඩපණ කිරීම සිදු වේ. මෙ වැනි අහිතකර මෘදුකාංග වෛරස, වර්ම් (Worm) වැනි බොහෝ ආකාරවලින් පැමිණිය හැකි අතර විවිධ ක්‍රමවලින් හානි පැමිණිය හැකි වේ.

- **සමාජීය මෙහෙයවීම් (Social Engineering):**

  මනෝ විද්‍යාත්මක ව මිනිසුන් රැවටීම තුළින්, කිසියම් ක්‍රියාවක් කර ගැනීම හෝ ඔවුන් සතු රහසිගත තොරතුරු දැන ගැනීම වේ.

- **තතුබාන ප්‍රහාර (Phishing)**

  මෙය ප්‍රමුඛතම සමාජීය මෙහෙයවීම් ක්‍රමයක් වන අතර ව්‍යාජ වෙබ් අඩවියක් හෝ විද්‍යුත් තැපැල් ලිපින භාවිත කර, සැක නො සිතෙන ලෙස පරිශීලකයකු සතු සංවේදී තොරතුරු සොරා ගැනීම සිදු වේ.

## 5. සයිබර් අවදානම් බැංකුවලට බලපාන්නේ කෙසේ ද?

සයිබර් අවදානම් නිසා බැංකුවලට විවිධ ආකාරයේ අලාභවලට මුහුණ දීමට සිදු විය හැකි ය. බලාත්ප්‍රවේශ ප්‍රහාර මගින් ආයතනයේ පරිගණක ජාලයට ඇතුළු වී, අනවසර මුදල් මාරු කිරීම් තුළින් ඍජු මූල්‍ය අලාභයක් ඇති විය හැකි අතර, බලාත්ප්‍රවේශ ප්‍රහාරයක තවත් ප්‍රමුඛ තර්ජනයක් වනුයේ බැංකු සතු ගනුදෙනුකරුවන්ගේ රහස්‍ය තොරතුරු අන් සතු වීම ය. බෙදා හරින ලද සේවා ප්‍රතිෂේධන ප්‍රහාර හේතුවෙන් හෝ අභ්‍යන්තර බිඳ වැටීමක් හේතුවෙන් බැංකුවක සියලු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් බිඳ වැටීමක් සිදු විය හැකි අතර, එ මගින් සියලු සේවා සැපයුම් නාලිකා අකර්මන්‍ය වනු ඇත. තව ද, සමාජ මෙහෙයවීම්වලට එරෙහි ව ඵලදායී ප්‍රතික්‍රියා මාර්ග ගත නො හැකි වීම බැංකුවක් කෙරෙහි ගනුදෙනුකරුවන් තබා ඇති විශ්වාසය දැඩි ලෙස පලුදු වීමට හේතු වනු ඇත.

## 6. බැංකුවලින් වාර්තා වූ ප්‍රධාන සයිබර් අවදානම් සිද්ධි:

- **1973 වසරේ නිව්යෝර්ක්හි යූනියන් ඩයිම් ඉතුරුම් බැංකුවේ වංචාව**

  බැංකු හා මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ සිදු වූ මුල් ම සයිබර් ආරක්ෂණය හා සම්බන්ධ සිදු වීමක් වනුයේ, 1973 වසරේ දී නිව්යෝර්ක්හි යූනියන් ඩයිම් ඉතුරුම් බැංකුවේ ටෙලර්වරුන්ගේ සුපරීක්ෂකවරයෙකු විසින් බැංකුවේ පරිගණක පද්ධතිවල ගිණුම් දත්ත වෙනස් කිරීමෙන් සිදු කරන ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 1.5ක වංචාවයි.

- **රෝයල් බැන්ක් ඔෆ් ස්කොට්ලන්ඩ්හි තොරතුරු තාක්ෂණ බිඳ වැටීම**

  2012 වසරේ දී, මෙම බැංකු සමූහය අසාර්ථක මෘදුකාංග යාවත්කාලීන කිරීමක් හේතුවෙන්, දින 6කට වඩා පැවතුණු සම්පූර්ණ තොරතුරු තාක්ෂණ බිඳ වැටීමකට මුහුණ දුණි. මෙම බිඳ වැටීම හේතුවෙන්, මිලියන 6.5කට අධික ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ගිණුම්වලට ප්‍රවේශ වීමට නො හැකි විය. එක්සත් රාජධානියේ මූල්‍ය නියාමකයන් විසින් පසු ව මෙම සිද්ධිය සඳහා බ්‍රිතාන්‍ය පවුම් මිලියන 56ක දඩයක් රෝයල් බැන්ක් ඔෆ් ස්කොට්ලන්ඩ් බැංකු සමූහය වෙත පනවන ලදී.

- **ජේපී මෝර්ගන් චේස් දත්ත සොරකම**

  සයිබර් ප්‍රහාරයක් හේතුවෙන්, 2014 වසරේ දී, ජේපී මෝර්ගන් චේස් ඇමෙරිකානු බැංකුව දත්ත සොරකමකට බඳුන් විය. එය මෙතෙක් ඉතිහාසයේ සිදු වූ විශාලතම දත්ත සොරකමක් ලෙස සැලකෙන අතර, ගනුදෙනුකරුවන්ගේ ගිණුම් මිලියන 83කට අධික ප්‍රමාණයක දත්ත සොරා ගැනිණ.

- **කාර්බනැක් (Carbanak) ප්‍රහාරය**

  2015 වසරේ දී, ජාත්‍යන්තර පොලිසිය සහ කැස්පර්ස්කි ලැබ් ආයතනය (පරිගණක ආරක්ෂක විසඳුම් සඳහා විශේෂීකරණයක් දක්වන සමාගමක්) වාර්තා කර සිටියේ රටවල් 30කට අයත් බැංකු 100කින් හෝ වැඩි ප්‍රමාණයකින් එක්සත් ජනපද ඩොලර් බිලියන 1ක පමණ මුදලක් ජාත්‍යන්තර සයිබර් අපරාධකරුවන් පිරිසක් විසින් කාර්බනැක් ලෙසින් නම් කර ඇති උසස් මට්ටමේ නොනවතින තර්ජනයක් (Advanced Persistent Threat) මගින් සොරාගෙන ඇති බවයි.

- **බංග්ලාදේශ මහ බැංකු ප්‍රහාරය:**

  2016 වසරේ පෙබරවාරි මාසයේ දී, බංග්ලාදේශ මහ බැංකුවේ නිලධාරීන් වශයෙන් ව්‍යාජ ලෙස

පෙනී සිටි බලාත්ප්‍රවේශකරුවන් පිරිසක් එක්සත් ජනපද ඩොලර් මිලියන 101ක මුදලක් නිව්යෝර්ක් ෆෙඩරල් රිසව් බැංකුවේ (Federal Reserve Bank of New York) පිහිටි බංග්ලාදේශ මහ බැංකු ගිණුමෙන් ශ්‍රී ලංකාවේ සහ පිලිපීනයේ පිහිටි පුද්ගලික බැංකු ගිණුම් වෙත මාරු කිරීමට සමත් විය. මෙම බලාත්ප්‍රවේශකරුවන් එක්සත් ජනපද ඩොලර් බිලියන 1ක වටිනාකමකින් යුතු මුදල් මාරු කිරීම් 35ක් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරා තිබුණි.

සයිබර් අවදානම් සම්බන්ධයෙන් ශ්‍රී ලාංකීය බැංකු ක්ෂේත්‍රයේ අත්දැකීම් ජාත්‍යන්තර අත්දැකීම් හා සමගාමී ව පවතී. එසේ වුව ද, මහා පරිමාණයෙන් තොරතුරු තාක්ෂණය යොදා ගනු ලබන අන්තර්ජාල හා ජංගම බැංකුකරණ අංශයන් හි බරපතල සයිබර් ආරක්ෂණ සිද්ධීන් අතලොස්සකට පමණක් ශ්‍රී ලංකාව මුහුණ දී ඇත. මෙ වැනි සිදු වීම් ඇති වී ඇති වාර ගණන සැලකීමේ දී, සමාජයීය මෙහෙයවීම් සහ තතුබාන ප්‍රහාර පළමු තැනට පත් වී ඇත.

## 7. සයිබර් අවදානම් කළමනාකරණ පද්ධති

තනි තනි බැංකු, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව නිරන්තරයෙන් සයිබර් අවදානම් කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාත්මක කරන අතර, මෑතක දී ගනු ලැබූ එ වැනි ක්‍රියා මාර්ග පහත පරිදි වේ.

- **මූලික ආරක්ෂණ ප්‍රමිතිය**

  2014 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන මූලික ආරක්ෂණ ප්‍රමිතිය, අවදානම් කළමනාකරණ නියෝගයක් ලෙස සියලු ම බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. මෙම මූලික ආරක්ෂණ ප්‍රමිතිය, තොරතුරු ආරක්ෂාව පිළිබඳ වන ISO-27001 ප්‍රමිතිය මත පදනම් ව ඇති අතර, තොරතුරු ආරක්ෂණ කළමනාකරණ සංවිධානය, තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය, තොරතුරු වත්කම් කළමනාකරණය, මෙහෙයුම් ආරක්ෂණය සහ තොරතුරු ආරක්ෂණ සිද්ධි කළමනාකරණය ඇතුළත් ව, තොරතුරු ආරක්ෂණයට අදාළ වසම් 14ක් ආවරණය කරනු ලබයි.

- **පරිගණක ආරක්ෂණ අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම**

  සිදුවීම්වලට මුහුණ දීම පිණිස, ශ්‍රී ලංකාව සයිබර් අවදානම්වලින් අරක්ෂා කිරීමේ කාර්යභාරය පවරා දෙමින්, ඉහළ යන සයිබර් ආරක්ෂණ සිදුවීම්වලට මුහුණ දීම පිණිස ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (SLCERT|CC) ශ්‍රී ලංකාවේ ජාතික පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (National CERT) ලෙස ස්ථාපනය කරන ලදී. 2014 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා සූදානම් කණ්ඩායම් සම්බන්ධීකරණ මධ්‍යස්ථානය හා බැංකු අංශය සමඟ ඒකාබද්ධ ව පිහිටුවන ලද බැංකු පරිගණක ආරක්ෂණ අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම (BankCSIRT) වර්තමානයේ දී FINCSIRT නමින් බැංකු හා මූල්‍ය ආයතනවල සයිබර් අවදානම් කළමනාකරණයට සහාය වේ.

## 8. බැංකු ගනුදෙනුකරුවන්ගේ වගකීම්

සෑම විට ම, ලබා ගන්නා සියලු ම බැංකු පහසුකම් පිළිබඳ ව සැලකිල්ලෙන් සිටීම ගනුදෙනුකරුවන්ගේ වගකීමකි. අවම වශයෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත හා එහි පුද්ගල හඳුනා ගැනීමේ අංකය (PIN) ආරක්ෂිත ව තබා ගැනීම, ණය පත්‍ර සුරක්ෂිත ව තබා ගැනීම හා ඒවා සුරක්ෂිත අන්තර්ජාල ගනුදෙනු සඳහා පමණක් භාවිත කිරීම වැනි මූලික ආරක්ෂණ ක්‍රියාමාර්ග ගැනීමට ගනුදෙනුකරුවන් විසින් වග බලා ගත යුතු ය. තව ද, අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් බැංකු සේවාවන් ලබා ගැනීමේ දී අදාළ බැංකු ආයතනය විසින් සපයන ආරක්ෂක අංග පිළිබඳ විමසිලිමත් වීම සහ පරිශීලකයන් හඳුනා ගැනීමේ තොරතුරු සුරක්ෂිත ව තබා ගැනීම ගනුදෙනුකරු සතු වගකීමකි.

තව ද, පරිශීලකයන් හඳුනා ගැනීමේ තොරතුරු සොරකම් කිරීම සඳහා විශාල වශයෙන් ව්‍යාජ විද්‍යුත් තැපැල් පණිවුඩ භාවිත කරන බැවින්, බැංකු ආයතනවලින් ලැබෙන විද්‍යුත් තැපැල් පණිවුඩ තහවුරු කර ගැනීම ද වැදගත් වේ.

මූලාශ්‍ර:

1. https://www.theirm.org/
2. http://www.interpol.int/

(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)

# මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ දී මෙන් ම ඊට අදාළ ව ගනු ලබන ක්‍රියාවලට අනුකූලතාව ඇති කර ගැනීම පිණිස ලොව පුරා විවිධ රටවල් විසින් “රීති මත පදනම් වූ ප්‍රවේශය” (Rule Based Approach) සහ “අවදානම මත පදනම් වූ ප්‍රවේශය” (Risk Based Approach) භාවිත කරනු ලැබේ. කෙ සේ වෙතත්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර සම්මුතීන්ගේ මෑත කාලීන ව සිදු වූ වෙනස්වීම් අනුව “රීති මත පදනම් වූ ප්‍රවේශයේ” පැවැති අඩුපාඩු මග හරවා ගැනීම සඳහා “අවදානම මත පදනම් වූ ප්‍රවේශය” වෙත මාරුවීමේ ප්‍රවණතා දක්නට ලැබේ.

1980 දශකයේ මුල් භාගයේ දී මත්ද්‍රව්‍ය ආශ්‍රිත ව සිදුකරන ලද මුදල් විශුද්ධිකරණය ඉහළ යෑම සහ එ මගින් වූ අවදානම් තත්ත්වය සලකා බලා ලොව පුරා මුදල් විශුද්ධිකරණ ක්‍රියාකාරකම් අඩු කිරීම සඳහා නිර්දේශ කිරීම, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා ඒවා නිරීක්ෂණය කිරීම සහ මූල්‍ය බුද්ධි තොරතුරු එක් රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ විමර්ශනය කිරීම සඳහා සංවිධානය වීම, ඒ සඳහා ප්‍රතිපත්ති/නිර්දේශ කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා 1989 දී පැරිසියේ පැවැති G7 රටවල සමුළුවේ දී මූල්‍ය කාර්ය සාධක බලකාය (FATF)[1] ස්ථාපනය කරන ලදී. ඒ අනුව ප්‍රථම වරට 1990 වසරේ දී මුදල් විශුද්ධිකරණය සඳහා වන නිර්දේශ 40ක් ඉදිරිපත් කරන ලදී. 2001 සැප්තැම්බර් 11 වන දින ඇමෙරිකා එක්සත් ජනපදයේ සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් අනතුරු ව ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම ද ඇතුළත් වන අයුරින් මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ තව දුරටත් පුළුල් කරන ලද අතර, 2001 ඔක්තෝබර් මාසයේ දී ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සම්බන්ධයෙන් විශේෂ නිර්දේශ 9ක් මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් හඳුන්වා දෙන ලදී. ඒ අනුව 2004 වර්ෂය අවසානයේ සිට මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සඳහා නිර්දේශ 40+9ක් වන පරිදි මූල්‍ය කාර්ය සාධක බලකායේ මූල්‍ය බුද්ධි විෂය පථය පුළුල් විය. 2012 පෙබරවාරි මාසයේ දී සිදු කරන ලද සංශෝධන සහ ඒකාබද්ධ කිරීම්වලින් අනතුරු ව නිර්දේශ 40කින් සමන්විත වන දැනට පවතින මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ඉදිරිපත් කෙරිණි.

මූල්‍ය අපරාධ මැඩලීමට තරම් ශක්තිමත් ක්‍රමවේද සැපයීම හරහා මූල්‍ය පද්ධතිය පිළිබඳ ඇති විශ්වසනීයත්වය තවදුරටත් ශක්තිමත් කිරීම මෙම සංශෝධනයන්හි ඉලක්කය විය. මෙම සංශෝධනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ රාමුවේ මූලික ස්ථරය හා අත්‍යවශ්‍ය පදනම බවට “රීති මත පදනම් වූ ප්‍රවේශය” වෙනුවට “අවදානම මත පදනම් වූ ප්‍රවේශය” ඉදිරිපත් වී ඇත.

“අවදානම මත පදනම් වූ ප්‍රවේශය” යටතේ සෑම රටක් ම සහ රට තුළ ක්‍රියාත්මක වන නියාමන බලධාරීන් සහ මූල්‍ය ආයතන විසින් තමන්ට මුහුණ දීමට සිදු වී ඇති මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ

1. Financial Action Task Force - FATF

අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා අවබෝධ කර ගැනීම කළ යුතු අතර, මෙම අවදානම් තත්ත්වයෙන් ක්‍රමවත් ලෙස අවම කර ගැනීම හා පාලනය කිරීම සඳහා ඵලදායී පියවර ගැනීමට කටයුතු කළ යුතු ය. ඇති විය හැකි අවදානම් තත්ත්වය සැලකිල්ලට නො ගෙන ම "රීති මත පදනම් වූ ප්‍රවේශයේ දී" සියලු ආකාරයේ ගනුදෙනුකරුවන් සහ අදාළ මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් එක හා සමාන අවධානයක් සහ සම්පත් දායකත්වයක් ලබා දීමට සිදු වේ. අනෙක් අතට, "අවදානම මත පදනම් වූ ප්‍රවේශය" යටතේ, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පාලනය කිරීමට ගනු ලබන පියවර, හඳුනා ගන්නා ලද අවදානම් තත්ත්වයන්ට අනුකූල අයුරින් පවතී ද යන්න තහවුරු කර ගැනීමට මූල්‍ය ආයතනයන්ට හැකියාව ඇත. එම නිසා මූල්‍ය ආයතනයට හඳුනාගත් අවදානම් සාධක පදනම් කර ගෙන, ලබාදුන් ප්‍රමුඛතාවන්ට අනුව සම්පත් බෙදා හැරීම සිදු කළ හැකි බැවින් "අවදානම් මත පදනම් වූ ප්‍රවේශය" මගින් ඵලදායි අයුරින් සම්පත් වෙන් කිරීමට ඉඩ ප්‍රස්තාව ලැබී ඇත.

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ ඇති අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා සම්පත් උපයෝගී කර ගැනීම සහ මූල්‍ය පද්ධති ස්ථාවරත්වය තහවුරු කිරීම මෙන් ම ගෝලීය වශයෙන් පවතින නියාමන අවශ්‍යතාව ළඟා කර ගැනීම යන අරමුණු අතර මනා සමබරතාවක් පවත්වා ගෙන යෑම සඳහා ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා කේන්ද්‍රීය ස්ථානය වන ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය (FIU)[2] විසින් "අවදානම මත පදනම් වූ ප්‍රවේශය" ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන වෙත හඳුන්වා දෙන ලදී.

මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ, 2016 ජනවාරි 27 දින 1951/13 දරන රජයේ ගැසට් පත්‍රය මගින් 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන් මූල්‍ය ආයතනයන් වෙත නිකුත් කරන ලදී. මූල්‍ය කාර්ය සාධක බලකායට අනුබද්ධිත කලාපීය ආයතනය වන මුදල් විශුද්ධිකරණය පිළිබඳ වූ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ (APG)[3] නිර්දේශයන්ට අනුව ශ්‍රී ලංකාව විසින් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා ඉටු කිරීම සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන සඳහා "අවදානම මත පදනම් වූ ප්‍රවේශයට" අදාළ උපදෙස් ලබා දීම යන අරමුණු දෙක ළඟා කර ගැනීම සඳහා මෙම රීතීන් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකාවේ සෑම මූල්‍ය ආයතනයක් ම "රීති මත පදනම් වූ ප්‍රවේශය" වෙනුවට "අවදානම මත පදනම් වූ ප්‍රවේශය" ක්‍රියාත්මක කළ යුතු අතර අදාළ නියාමන අධිකාරීන් විසින් පනවනු ලබන ක්‍රමවේදයන්ට අනුව කටයුතු කළ යුතු ය. ඒ අනුව, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ ව රටක් වශයෙන් ලබා ගත යුතු අනුකූලතාව පිළිබඳ ව සතුටුදායක ප්‍රගතියක් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම වෙත ඉම 2016 ජනවාරි 31 දින වන විට වාර්තා කිරීමට ශ්‍රී ලංකාවට හැකි විය.

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව, "මූල්‍ය ව්‍යාපාර" යන නිර්වචනයට ඇතුළත් සියලු ම ආයතන සඳහා මෙම රීති අදාළ වේ. මෙම රීතිවලට අනුව, මූල්‍ය ආයතන විසින් "අවදානම මත පදනම් වූ ප්‍රවේශයට" පිවිසීම අවශ්‍ය වේ. ඒ අනුව, සෑම මූල්‍ය ආයතනයක් ම මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ අවදානම හඳුනා ගැනීමත්, සිය මෙහෙයුම් කටයුතුවලට එයින් ඇති විය හැකි බලපෑම කුමක්ද යන්නත් පිළිබඳ ව විශ්ලේෂණය කිරීම හා අවබෝධය ලබා ගැනීම සිදු කළ යුතු ය. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ අවදානම ඇගයීම සඳහා විස්තරාත්මක අවදානම් ඇගයීමක් සිදු කිරීමේ දී සෑම මූල්‍ය ආයතනයක් විසින් ම එක් එක් ගනුදෙනුකරුවන්ගේ අවදානම් පැතිකඩයන් (Risk Profile) හඳුනා ගැනීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර ක්‍රියා පිළිවෙළක් අනුගමනය කළ යුතු වනු ඇත.

ගනුදෙනුකරුවන්ගේ අවදානම් පැතිකඩයන් නිර්ණය කිරීමේ දී, මූල්‍ය ආයතන විසින් ඒ ඒ අවස්ථාවන්ට අදාළ කරුණු, එ නම්, ගනුදෙනුකරු අයත් වන කාණ්ඩය, වෘත්තිය, ඔහුට ආදායම් ලැබෙන මාර්ගය, ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම හෝ ගනුදෙනුකරුවාගේ සමාරම්භක පදිංචිය ඇති රට (Country of Origin) භාවිත කරන ලද සේවාවන්, බෙදා හැරීමේ මාර්ග, ගිණුම්වල ස්වභාවය හා අවශ්‍යතාව, සම්බන්ධිත ගිණුම් හා ව්‍යාපාරික ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගත යුතු වේ. එ සේ ම ගනුදෙනුකරු හා සම්බන්ධ සමස්ත මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ අවදානම් තත්ත්වය නිර්ණය කිරීමේ දී, ගනුදෙනුකරුට අදාළ අනෙකුත් අවදානම් දර්ශක ද සැලකිල්ලට ගත

2. Financial Intelligence Unit
3. Asia Pacific Group of Money Laundering

යුතු ය. තව ද, ගනුදෙනුකරුවෙකු ලෙස පිළිගැනීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන්, ගනුදෙනුකරු පිළිබඳ නිසි අවධානයෙන් කටයුතු කිරීම (Customer Due Diligence) සහ ව්‍යාපාරික සම්බන්ධතාවන් පිළිබඳ ව දැනට පවතින නිරීක්ෂණ, ගනුදෙනුකරුගේ අවදානම් පැතිකඩයන් සමඟ සමගාමී ව පැවතිය යුතු වේ.

ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ දී "සරල කරන ලද රීතීන්" (Simplified Rules) සහ "ප්‍රවර්ධිත රීතීන්" (Enhanced Rules) උපයෝගී කර ගැනීම, ප්‍රතිලාභී හිමිකාරිත්වය (Beneficial Owner) හඳුනා ගැනීම සහ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා සලසා ඇති විධිවිධාන ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීමට ඉවහල් වේ. තව ද, දේශපාලනික ව්‍යුහයට අනාවරණය වූ තැනැත්තන් (Politically Exposed Persons) පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම, නව තාක්ෂණය අනුගත කර ගැනීම, මූල්‍ය ආයතනයන්හි ඉහළ කළමනාකාරිත්වයෙන් ලැබිය යුතු දායකත්වය, විද්‍යුත් ප්‍රේෂණ කටයුතු කිරීම සහ කලාතුරකින් පැමිණෙන ගනුදෙනුකරුවන් සඳහා මුදල් හෝ විද්‍යුත් හුවමාරු සම්බන්ධයෙන් ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ පියවර, ආයතනික සම්බාධක සහ අනුකූල නො වීම සඳහා වන සම්බාධක ආදිය සඳහා වන නියාමන විධිවිධානයන් දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට අනුකූල වන ආකාරයට ආවරණය කර ඇත.

මූල්‍ය ආයතනයක ගනුදෙනුකරුවෙකු ලෙස පිළිගැනීමේ ප්‍රතිපත්තිය, බැංකු සහ අනෙකුත් සේවාවන් ලබා ගැනීම සඳහා එම ගනුදෙනුකරුවෙකුගේ ප්‍රවේශය වැළැක්වීමක් සිදු නො වන බවට වග බලා ගැනීම ඉතා වැදගත් වේ. එ බැවින් "අවදානම මත පදනම් වූ ප්‍රවේශය" හරහා මූල්‍ය අපරාධ මැඩලීම සඳහා දැනට පවතින පියවරවල වෙනසක් සිදු නො කොට මූල්‍ය පද්ධතියට ඇතුළත් නො වන කණ්ඩායම් මූල්‍ය පද්ධතියට අන්තර්ග්‍රහණය කිරීම දිරිමත් කිරීමක් සිදු කෙරේ. මේ අයුරින් ම, මුදල් විශුද්ධිකරණ හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමට අදාළ අවදානම වැඩි අවස්ථාවන්හි, මූල්‍ය ආයතන මගින් එම අවදානම් අඩු කිරීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය ගනුදෙනුකරු සඳහා නිසි අවධානයෙන් කටයුතු කිරීමට අදාළ ප්‍රවර්ධිත පියවර ගත යුතු වේ. නිදසුනක් ලෙස, සිය ගිණුමේ සැලකිය යුතු ශේෂයක් පවත්වා ගෙන යෑමට සහ තාර්කික නො වන ලෙසින් නිරන්තරයෙන් විදේශ හරහා විද්‍යුත් ප්‍රේෂණ සිදු කිරීමට බලාපොරොත්තු වන ගනුදෙනුකරුවෙකු සඳහා ගනුදෙනුකරු පිළිබඳ නිසි අවධානයෙන් කටයුතු කිරීමේ ප්‍රවර්ධිත රීතින් අවශ්‍ය විය හැක.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා "අවදානම මත පදනම් වූ ප්‍රවේශයක්" ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වනුයේ අපරාධකරුවන් විසින් මූල්‍ය පද්ධතිය අවභාවිත කිරීමෙන් ආරක්ෂා කර ගැනීමයි. තව ද රට තුළ මූල්‍ය අන්තර්ග්‍රහණය ඉහළ නැංවීම සඳහා ද "අවදානම මත පදනම් වූ ප්‍රවේශය" දායක වේ. එ බැවින්, "අවදානම මත පදනම් වූ ප්‍රවේශය" රටේ මූල්‍ය පද්ධතියේ මෙන් ම සමස්ත ආර්ථිකයේ ස්ථාවරත්වය පවත්වා ගෙන යාමට ඉවහල් වේ.

මූලාශ්‍ර :


1. FATF (2010), National Money Laundering and Terrorist Financing Risk Assessment, FATF, Paris.

2. FATF (2012), International standards on Combating Money Laundering and the Financing of Terrorism & Proliferation - The FATF Recommendations, FATF, Paris.

3. FATF (2014), Guidance for a Risk-Based Approach - The Banking Sector, FATF, Paris.

4. FATF (2015), Guidance for a Risk-Based Approach - Effective supervision and enforcement by AML/CFT supervision of the financial sector and law enforcement, FATF, Paris


(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව, ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා සම්බන්ධයෙන් වන සමාජ-ආර්ථික අභියෝග

නිදහස ලැබූ දින සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව ක්‍රමයෙන් කෘෂිකර්මාන්තය මූලික කර ගත් අඩු ආදායම් ආර්ථිකයක සිට වඩා විවිධාංගීකරණය වූ සේවා මූලික කර ගත් පහළ මැදි ආදායම් ලබන ආර්ථිකයක් බවට පත් වී ඇත. විශේෂයෙන් ම අධ්‍යාපනය සහ සෞඛ්‍යය වැනි සමාජ සංවර්ධන අංශ තුළ ඇති වූ කැපී පෙනෙන සංවර්ධනය මෙම ආර්ථික පරිවර්තනයට වඩාත් උපකාරී විය. ශ්‍රී ලංකාව සංවර්ධන ප්‍රතිපත්ති චක්‍රය තුළ ජයග්‍රහණයක් අත් කර ගෙන තිබුණ ද විශේෂයෙන් ම දරිද්‍රතාව, ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා වැනි අංශවල පවතින ගැටලු හේතුවෙන් එම වර්ධනය පවත්වා ගෙන යෑමේ දී සමාජ ආර්ථික පරිවර්තනය කෙරෙහි අවධානය යොමු කිරීමට සිදු ව ඇත. ආර්ථිකයේ සෑම අංශයක ම විවිධ අභියෝග පවතින අතර දරිද්‍රතාව, ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා වැනි ගැටලු මගින් ආර්ථික වර්ධනය දැඩි ලෙස දුර්වල කිරීමට සහ සමාජ නොසන්සුන්තාව ඇති කිරීමට හැකි බව අධ්‍යයන මගින් පෙන්වා දෙයි. එම නිසා, ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහ තිරසාර ආර්ථික වර්ධනය හා සංවර්ධනය ළඟා කර ගැනීමට මෙම විශේෂිත අංශ තුනෙහි අභියෝග සලකා බැලීම අත්‍යවශ්‍ය වේ.

**දරිද්‍රතාව**

"දරිද්‍රතාව යනු කුමක් ද කියා මගෙන් නොවිමසන්න. මක් නිසා ද යත්, මගේ නිවසින් පිටත දී ඔබට එය හමු වී ඇත. නිවස දෙස බලා එහි ඇති සිදුරු සංඛ්‍යාව ගණන් කරන්න. මා ඇඳ සිටින ඇඳුම් සහ මගේ උපකරණ දෙස බලන්න. සියලු දෙයක් දෙස ම බලා ඔබ දකින දේ ලියන්න. ඒ ඔබ දකින දෙය දරිද්‍රතාවයි."

- දිළිඳු පුද්ගලයෙක්, කෙන්යාව 1997[1]

1 "Can Anyone Hear Us? Voices From 47 Countries". Deepa Narayan with Raj Patel, Kai Schafft, Anne Rademacher and Sarah Koch-Schulte, Poverty Group, PREM" World Bank" December 1999, P.26.

දරිද්‍රතාව ලෙස සාමාන්‍යයෙන් නිර්වචනය කරනු ලබන්නේ කුටුම්භයන්ට හා පුද්ගලයින්ට ඔවුන්ගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට සම්පත් හෝ හැකියාවන් පවතී ද යන්නයි. දරිද්‍රතාව හා සබැඳි වූ දුෂ්කරතා නැති කිරීම සඳහා බහුවිධ ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද තවදුරටත් පවතින දරිද්‍රතාවයේ සංකේත හේතුවෙන්, ගෝලීය සංවර්ධන න්‍යාය පත්‍රයේ දරිද්‍රතාව අඩු කිරීම සඳහා නිරන්තරයෙන් ම ප්‍රමුඛස්ථානයක් ලැබී ඇත.

ශ්‍රී ලංකාව දරිද්‍රතාව අඩු කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇති අතර ඒ අනුව නියමිත කාලය වූ 2015ට වසර 7කට පෙරාතු ව ජාතික මට්ටමින් දිළිඳුබව අඩකින් අඩු කිරීමේ සහශ්‍ර සංවර්ධන අභිමතාර්යන්හි (Millennium Development Goals) වන ඉලක්ක සපුරා ගැනීමට හැකියාව ලැබී ඇත. දරිද්‍රතා රේඛාවට[2] පහළින් ජීවත් වන පුද්ගලයින් මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දක්වන ජනගහන දරිද්‍රතා දර්ශකය, දරිද්‍රතාව මැනීම සඳහා බහුල ව ම භාවිත කරන මිම්ම වන අතර, ඒ අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව 1995/96 වසරේ පැවැති සියයට 28.8 සිට 2009/10 වසර වන විට සියයට 8.9 දක්වා ද 2012/13 වසර වන විට සියයට 6.7 දක්වා ද අඩු වී ඇත. 2009/10 වසරේ දරිද්‍රතා දර්ශකය අනුව මිලියන 1.8ක් වූ දරිද්‍රතාවෙන් පෙළෙන පුද්ගලයින් සංඛ්‍යාවට සාපේක්ෂ ව 2012/13 වසරේ දී දළ වශයෙන් මිලියන 1.3ක් පමණ විය. පුද්ගලයෙකු සඳහා දිනකට <u>එක්සත් ජනපද</u> ඩොලර් 1.25ක් (2005 වසරේ දී ක්‍රය

2 2005 වසරේ ක්‍රයශක්ති සාම්‍යයට අනුව, මාසික ඒක පුද්ගල මුළු මූර්ත පරිභෝජන වියදම රුපියල් 3,624ට අඩු ගෘහ කාණ්ඩයන්හි වෙසෙන පුද්ගලයින් දරිද්‍රතාවෙන් පෙළෙන්නන් ලෙස ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාව අර්ථ දක්වා ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වසර තුනකට වරක් පවත්වනු ලබන ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ (Household income and Expenditure Survey) දත්ත ඇසුරින් මූලික අවශ්‍යතා සඳහා වියදම් (Cost of Basic Needs) ක්‍රමය යොදා ගෙන නිල දරිද්‍රතා රේඛාව නිර්ණය කර ඇත. නවතම ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය 2012/13 වර්ෂ සඳහා විය.

ශක්ති සාම්‍යයට) ලෙස සංසන්දනය කිරීම සඳහා භාවිත කරනු ලබන දැඩි දරිද්‍රතා රේඛාව භාවිත කරන ලද ලෝක බැංකු වාර්තාවකට අනුව ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අන්තර්ජාතික සම්මතයට වඩා අඩු අගයක පවතී.[3] මෙම නිර්වචනයට අනුව, 2002 වසරේ සියයට 13ක් ව පැවැති ශ්‍රී ලංකාවේ දැඩි දරිද්‍රතා මට්ටම 2012/2013 වසරේ දී සියයට 3කට වඩා අඩු අගයකට පහත වැටුණි.

දරිද්‍රතාවේ මෙම සැලකිය යුතු පහළ යෑම, විශේෂයෙන් ම දරිද්‍රතා රේඛාවෙන් පහළ මට්ටමේ ජීවත් වන පුද්ගලයින් ඇතුළු ව අඩු ආදායම්ලාභී ජන කොටස්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා පැවැති රජයන් විසින් ක්‍රියාත්මක කරන ලද නොයෙකුත් වැඩසටහන්වල ප්‍රතිඵලයක් විය. ඍජු මූල්‍ය ආධාර, ජීවනෝපාය සඳහා ආධාර වැඩසටහන්, සාමාන්‍යයෙන් අඩු ආදායම් සහිත පුද්ගලයින් ඉලක්ක කර ගත් සහනාධාර වැඩසටහන්, ආහාර සහනාධාර වැඩසටහන් සහ නිදහස් අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි සාමාන්‍ය පොදු සුබසාධනය සඳහා වූ රාජ්‍ය වියදමින් සිදු කළ වැඩසටහන් යනාදිය මේ සඳහා ඇතුළත් විය.

වසර ගණනාවක් තුළ දරිද්‍රතාව ක්‍රමයෙන් අඩු කර ගනිමින් සහ 2000-2015 අතර කාලය තුළ දරිද්‍රතාව හරි අඩකින් අඩු කිරීමේ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ සපුරා ගත් රටක් ලෙස ශ්‍රී ලංකාව, 2030 වසරේ දී තිරසාර සංවර්ධන අභිමතාර්ථ යටතේ ළඟා කර ගැනීමට අපේක්ෂා කරන සෑම තැනක ම සියලු ම ආකාරවලින් පවතින දරිද්‍රතාව අවසන් කිරීමේ නව අභියෝගයට මේ වන විට මුහුණ දී ඇත. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ විශේෂයෙන් ම අඩු අවධානයට ලක් වූ දිස්ත්‍රික්ක තුළ පවතින අන්ත දුප්පත්කම තුරන් කර විය හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව මෙ මගින් ඉස්මතු කර දක්වයි.

ශ්‍රී ලංකාවේ 2012 ජන හා නිවාස සංගණනය සහ 2012/13 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත මත පදනම් ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ලෝක බැංකුවේ ගෝලීය දරිද්‍රතා පරිචයන් පිළිබඳ කණ්ඩායම සකස් කළ දරිද්‍රතා සිතියම මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ දරිද්‍රතා අනුපාත අතර පවතින සැලකිය යුතු භූගෝලීය විෂමතා ඉස්මතු කර දක්වයි.[4] උදාහරණයක් ලෙස මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 5.3 සිට සියයට 45.1 දක්වා විශාල ලෙස විචලනය වී ඇත. මොණරාගල දිස්ත්‍රික්කයේ සියලු ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සැලකිය යුතු මට්ටමේ උග්‍ර දරිද්‍රතාවක් පැවතිණි. සමහර දිස්ත්‍රික්කවල දරිද්‍රතාව අඩු මට්ටමක පැවැති අතර සමස්තයක් ලෙස ගත් කළ මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කින්නියා වැනි සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල දරිද්‍රතාවෙන් පෙළෙන ප්‍රදේශ පැතිර පවතී. ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 0.6ක් වාර්තා වී ඇති ශ්‍රී ලංකාවේ අඩු ම දරිද්‍රතාවක් පවතින කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 45.1ක් වාර්තා වී ඇති මඩකලපු දිස්ත්‍රික්කයේ මන්මුනෙයි-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අතර පවතින පරතරය මගින් වැඩි වශයෙන් පවතින දරිද්‍රතාවයේ භූගෝලීය විෂමතා නිරීක්ෂණය කළ හැකි ය. ජනගහන දරිද්‍රතා දර්ශකය ඉහළ මට්ටමක පැවතීම මගින්, ජනගහනයෙන් ඉහළ ප්‍රතිශතයක් දිළිඳුභාවයෙන් පෙළෙන බව සෑම විට ම පිළිබිඹු නො කරන බව දරිද්‍රතාවේ ප්‍රාදේශීය ව්‍යාප්තිය මගින් ද පෙන්වා දෙයි. මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල ජනගහන දරිද්‍රතා දර්ශක අගයන් පිළිවෙළින් සියයට 28.8ක් සහ සියයට 20.1ක් වුව ද මෙම දිස්ත්‍රික්කවල සිටින ජනගහනය රටෙහි මුළු දිළිඳු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.4ක් පමණක් වීම සහ ජනගහන දරිද්‍රතා දර්ශක අගය සියයට 6.5ක් වන කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිළිඳු ජනගහන ප්‍රතිශතය සියයට 7.6ක් වීම මගින් මෙය පිළිබිඹු වේ.

මෙම කලාපීය විෂමතා, සමස්ත දරිද්‍රතාව අඩු කර ගැනීමෙන් මේ දක්වා රට ළඟා කර ගත් ජයග්‍රහණ සඳහා පීඩා එල්ල කර ඇති බැවින් පවත්නා අසමත් අංශයන් සහ රටෙහි උග්‍ර දරිද්‍රතාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා අරමුණු කරගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. විවිධ අංශ ඔස්සේ වන දරිද්‍රතා පරතරය සඳහා ආදායම් ප්‍රමාණය අන්තර්ගත වුව ද ඒ මත සීමා නො වන බවට අධ්‍යයනයන් මගින් පෙන්වා දුන් පරිදි දරිද්‍රතාවේ බහුමාන ස්වභාවය කෙරෙහි ප්‍රතිපත්ති අරමුණුගත කිරීම වැදගත් වේ. දුර්වල අධ්‍යාපනය, මූලික පහසුකම් ලබා ගැනීමට ඇති නො හැකියාව (ආරක්ෂිත ජලය, සනීපාරක්ෂාව, සෞඛ්‍ය, ඌන පෝෂණය වැනි), දුර්වල ශ්‍රම වෙළෙඳපොළ සබඳතා සහ සමස්තයක් ලෙස සඵල ආර්ථික වත්කම් ලබා ගැනීමට ඇති නො හැකියාව මේ

3 Oxfam Issue Briefing, Wealth: Having it All and Wanting More, January 2015

4 The Spatial Distribution of Poverty in Sri Lanka, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - Sri Lanka and Poverty Global Practice, ලෝක බැංකු සමූහය - 2015 අගෝස්තු

**දිස්ත්‍රික්කය අනුව ජනගහන**
**දරිද්‍රතා දර්ශකය : 2009/10 සහ 2012/13**

| දිස්ත්‍රික්කය | සමීක්ෂණ කාලය | |
|---|---|---|
| | 2009/10* | 2012/13 |
| කොළඹ | 3.6 | 1.4 |
| ගම්පහ | 3.9 | 2.1 |
| කළුතර | 6.0 | 3.1 |
| නුවර | 10.3 | 6.2 |
| මාතලේ | 11.5 | 7.8 |
| නුවරඑළිය | 7.6 | 6.6 |
| ගාල්ල | 10.3 | 9.9 |
| මාතර | 11.2 | 7.1 |
| හම්බන්තොට | 6.9 | 4.9 |
| යාපනය | 16.1 | 8.3 |
| මන්නාරම | - | 20.1 |
| වවුනියාව | 2.3 | 3.4 |
| මුලතිව් | - | 28.8 |
| කිලිනොච්චි | - | 12.7 |
| මඩකලපුව | 20.3 | 19.4 |
| අම්පාර | 11.8 | 5.4 |
| ත්‍රිකුණාමලය | 11.7 | 9.0 |
| කුරුණෑගල | 11.7 | 6.5 |
| පුත්තලම | 10.5 | 5.1 |
| අනුරාධපුර | 5.7 | 7.6 |
| පොළොන්නරුව | 5.8 | 6.7 |
| බදුල්ල | 13.3 | 12.3 |
| මොනරාගල | 14.5 | 20.8 |
| රත්නපුර | 10.5 | 10.4 |
| කෑගල්ල | 10.8 | 6.7 |
| **ශ්‍රී ලංකාව** | **8.9** | **6.7** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
* මන්නාරම, මුලතිව් හා කිලිනොච්චි
දිස්ත්‍රික්කවල දත්ත ඇතුළත් නො වේ.


තුළ අන්තර්ගත වේ. රටක දරිද්‍රතාවන් පෙළෙන්නන් හට ද, සමාජ ආර්ථික යටිතල පහසුකම් ලබා ගැනීමට නීතිමය අයිතිවාසිකමක් ඇති බැවින් ඔවුන්ගේ ගැටලු සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට රජයට වගකීමක් ඇත. අන්ත දුගීභාවයෙන් පෙළෙන්නන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වන රජයේ සුභසාධන වැඩසටහන්වලින් ආවරණය වන ප්‍රමාණය ඉහළ දැමීමට අමතර ව එ වැනි වැඩසටහන්වල ඵලදායීතාව වර්ධනය කිරීමට අවශ්‍ය ඉලක්ක සහතික කිරීම වැදගත් වේ. අනෙකුත් සාර්ව මට්ටමේ ක්‍රියාමාර්ග රැකියා වියුක්තියෙන් පෙළෙන තරුණ කොටස් සඳහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම, යටිතල පහසුකම් සඳහා වන රාජ්‍ය ආයෝජන වැඩි කිරීම, ග්‍රාමීය ප්‍රදේශවල පොදු භාණ්ඩ සඳහා වන ප්‍රතිපාදන ඉහළ නැංවීම සහ වයස්ගත ජනගහනය අරමුණු කරගත් සමාජීය ආරක්ෂණ උපායමාර්ග නිර්මාණය කිරීම යනාදිය සඳහා සාර්ව මට්ටමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

## ආදායම් විෂමතාව

"බෙදී යෑම මගින් අතිරික්ත ඉවත් කළ යුතු අතර ප්‍රමාණවත් තරම් සෑම මිනිසෙකුටම හිමි විය යුතුය."

- විලියම් ශේක්ෂ්පියර්, ඉංග්‍රීසි නාට්‍ය රචක (1564-1616)

**ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ**
**ප්‍රාදේශීය ව්‍යාප්තිය - 2012/2103**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


ආදායම් බෙදීයෑමේ අසමානතාව, පරිභෝජනය සහ සමස්ත ජනගහනයේ පරිභෝජනය හෝ වෙනත් කටයුතු අවධානය යොමු කළ යුතු අනෙකුත් වැදගත් අංශ වේ. ඔක්ස්ෆාම් (Oxfam) ට අනුව, 2014 වසරේ දී ලෝකයේ ධනවත් ම සියයට 1ක පිරිසට ගෝලීය ධනයෙන් සියයට 48ක් අයිති වූ අතර ඉතිරි සියයට 52, වැඩිහිටි ජනගහනයේ අනෙකුත් සියයට 99ක පිරිස අතර බෙදී ගොස් ඇත.[5] නැගී එන ආර්ථිකයන්හි වර්ධනය හේතුවෙන් රටවල් අතර පවත්නා අසමානතා සුළු වශයෙන් අඩු වී ඇති අතර, රටවල් අතර පවතින එම විෂමතාවලින් ජනතාවට

5. Oxfam Issue Briefing, Wealth: Having It All and Wanting More, 2015 ජනවාරි

බොහෝ ගැටලු ඇති වේ. ලොව පුරා රටවල්වල වෙසෙන ධනවත් සුළුතරය විසින් ජාතික ආදායමෙහි වැඩි වන කොටස් හිමිකම සැමවිට ම අත් කර ගනී. මෙම ප්‍රවණතාවෙන් පෙන්නුම් කෙරෙන පරිදි රටවල් තුළ සහ රටවල් අතර වන විෂමතාවෙහි අඩු වීම, දරිද්‍රතාවෙහි ප්‍රාදේශීය ව්‍යාප්තිය යටතේ වන එක් මූලික අරමුණක් ලෙස හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ වාර්ෂික ඒක පුද්ගල ආදායම 2003 වසරේ දී එක්සත් ජනපද ඩොලර් 981 සිට 2015 වසරේ දී එක්සත් ජනපද ඩොලර් 3,925 තෙක් ඉහළ ගිය ද, සැලකිය යුතු ආදායම් විෂමතා අඛණ්ඩ ව පැවතුණි. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012/13 නවතම ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව, මධ්‍යනය හා මධ්‍යස්ථ මාසික ගෘහ ඒකක ආදායම් පිළිවෙළින් රුපියල් 45,878ක් හා රුපියල් 30,814ක් විය. දිස්ත්‍රික්ක මට්ටමේ සංඛ්‍යා සැලකූ විට, කොළඹ දිස්ත්‍රික්කය ඉහළ ම මාසික මධ්‍යනය ගෘහ ඒකක ආදායම (රුපියල් 77,723) වාර්තා කළ අතර, මුලතිව් දිස්ත්‍රික්කය පහළ ම අගය වූ රුපියල් 23,687ක් වාර්තා කළේ ය. ඒ අනුව, ප්‍රතිශත වශයෙන් ගත් කළ, ඉහළ ම දශමක සමස්ත කුටුම්භ ආදායමෙන් සියයට 38ක ප්‍රතිශතයක් ලබා ගන්නා ලද අතර, ඉහළ ම සියයට 20ක ප්‍රතිශතය සමස්ත කුටුම්භ ආදායමෙන් සියයට 53ක ප්‍රතිශතයක් හිමි කර ගන්නා ලදී.

### ආදායම් අසමානතාව හා ආදායම් බෙදීයෑම




මූලය: ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/13, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

සංසන්දනාත්මක ව බැලූ කළ, රට තුළ ආදායම් බෙදී යෑමේ සැලකිය යුතු විෂමතාවක් පිළිබිඹු කරමින් ගෘහ ඒකකයන්ගෙන් සියයට 50ක්, සමස්ත ගෘහ ඒකක ආදායමෙන් සියයට 20ක අගයකට හිමිකම් කියයි. 2012/13 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ තනි පුද්ගල හෝ ගෘහ ඒකක අතර ආදායම් බෙදී යෑම පූර්ණ සමානුපාතික බෙදී යෑමකින් අපගමනය වන ප්‍රමාණය මනිනු ලබන ගිනි සංගුණකය[6] 0.48ක අගයක පැවතිණි. 2009/10 ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය අනුව වාර්තා වූ 0.49 හා සැසඳීමේ දී ආදායම් ව්‍යාප්තියේ ආංශික වර්ධනයක් පිළිබිඹු කළ ද, ආදායම් සමතාව වැඩිදියුණු කිරීමට සුදුසු උපායයන් ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී.

### දශමක කාණ්ඩ සහ ආදායම් බෙදීයෑම

| දශමක කාණ්ඩය | | ආදායම් කාණ්ඩය (රුපියල්) | ආදායම් බෙදීයෑම (%) | ආදායම් බෙදීයෑම සමුච්චිත (%) |
|---|---|---|---|---|
| කාණ්ඩය | සමුච්චිත අගය (%) | | | |
| 1 | 10 | 10,836 ට අඩු | 1.5 | 1.5 |
| 2 | 20 | 10,836 - 16,531 | 3.0 | 4.5 |
| 3 | 30 | 16,532 - 21,286 | 4.1 | 8.6 |
| 4 | 40 | 21,287 - 25,903 | 5.1 | 13.7 |
| 5 | 50 | 25,904 - 30,814 | 6.2 | 19.9 |
| 6 | 60 | 30,815 - 36,758 | 7.3 | 27.2 |
| 7 | 70 | 36,759 - 45,000 | 8.9 | 36.1 |
| 8 | 80 | 45,001 - 57,495 | 10.9 | 47.0 |
| 9 | 90 | 57,496 - 83,815 | 14.9 | 61.9 |
| **10** | **100** | **83,815 ට වැඩි** | **38.0** | **100.0** |

මූලය: ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය 2012/13, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

6 ගිනි දර්ශකය ආර්ථිකයක පුද්ගලයන් හා පවුල් ඒකක අතර ආදායම බෙදී යෑම හෝ සමහර අවස්ථාවල පරිභෝජන වියදම පූර්ණ සමානුපාතික බෙදීයෑමකින් අපගමනය වන ප්‍රමාණය මගින් මනිනු ලැබේ. ලෝරන්ස් වක්‍රය, වඩාත් ම දිළිඳුතම පුද්ගලයන්ගෙන් හෝ පවුල් ඒකකයෙන් පටන්ගෙන සමුච්චිත මුළු ආදායමේ ප්‍රතිශතය සමුච්චිත ලබන්නන්ගේ මුළු ගණනට සමානුපාත ව ලකුණු කර පෙන්වයි. ගිනි දර්ශකය, පූර්ණ සමානාත්මක ව පෙන්වන මනඃකල්පිත රේඛාවක් හා ලෝරන්ස් වක්‍රය අතර ප්‍රදේශය, රේඛාවෙන් පහළ උපරිම ප්‍රදේශයේ ප්‍රතිශතයක් ලෙස මනිනු ලබයි. එබැවින්, 0කට සමාන ගිනි දර්ශකය පූර්ණ සමානතාව නියෝජනය කරන අතර, 1 පූර්ණ අසමානතාව පෙන්වයි. (ලෝක බැංකුව, http://data.worldbank.org/indicator/Si.Pov.GINI)

## ළමා පෝෂණ ඌනතාව[7]

*"කුසගින්න හා මන්දපෝෂණය, ළමයින්ට අහිතු ප්‍රතිවිපාක ඇති කරන අතර, අඩු බර උපත් හා උපත් විකලතා, ස්ථූලතාව, මානසික හා ශාරීරික සෞඛ්‍ය ගැටලු සහ අධ්‍යාපන කටයුතු දුර්වල වීම යනාදිය සමග ද සම්බන්ධය."*

- මේරියන් රයිට් එඩ්ල්මන්, ප්‍රාරම්භක/ ළමා ආරක්ෂණ අරමුදලේ සභාපති[8]

උග්‍ර දරිද්‍රතාව මන්දපෝෂණය හා ගැබ් වූ කරුණක් බව, ආහාර බහුල ලෝකයක පවතින කුසගින්න හා පෝෂණ ඌනතාව මගින් අඟවනු ලබයි. කෙ සේ වෙතත්, පෝෂණ ඌනතා විශේෂයෙන් ම ක්ෂුද්‍ර පෝෂණ ඌනතා, දරිද්‍රතාවෙන් මිදීමට පුද්ගලයන්ට ඇති හැකියාවට බලපෑම් කරන හෙයින් එය ද දරිද්‍රතාවට ප්‍රධාන හේතුවකි. ළමුන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය අඩු වීම, පාසල් පැමිණීම හා කාර්යසාධනය නතර වීමට ප්‍රබල ව බලපාන අතර, එම නිසා අධ්‍යාපනය සඳහා වූ ආයෝජනයන්ගේ ඵලදායීතාව හීන වීම සහ ඉන් අනතුරු ව ඔවුන් ශ්‍රම බලකායට ඇතුළත් වීමේ දී නිෂ්පාදන ධාරිතාවට අහිතකර ව බලපායි. එ වැනි පුද්ගලයන් පසු ව කුසගින්න, අඩු ඵලදායීතාව සහ දැඩි දරිද්‍රතා උගුලට හසු වේ.

2012 වසරේ දී අවුරුදු 5ට අඩු සමස්ත ළමා ජනගහනයෙන් සියයට 13ක් වර්ධනය නතර වූවන් ලෙස සහ සියයට 24ක් අඩු බරැති ළමුන් ලෙස වාර්තා වෙමින් ශ්‍රී ලංකාවට දැඩි බරක් වූ ළමා පෝෂණ ඌනතාවකට මුහුණ දෙනු ලබයි. නීරක්තිය, අඩු බර උපත්, වර්ධනය නතර වීම, අඩු බර හා උසට සරිලන බර නොමැති වීම යනාදී විවිධ දර්ශක සැලකූ කළ, ශ්‍රී ලංකාවේ කාර්යසාධනය, ඉහළ සෞඛ්‍ය ජයග්‍රහණ ලබා ගත් රටවලට වඩා, ඉතා පහළ මට්ටමේ සෞඛ්‍ය තත්ත්වයන් ඇති රටවලට වඩා සමීප මට්ටමක පවතී.

ආර්ථිකය ඉහළ වර්ධන ප්‍රවණතාවක පැවතීම සහ ජීවන තත්ත්වය ඉහළ යෑම මධ්‍යයේ වුව ද මෙම අංශය තුළ පසුගිය දශකය තුළ සිදු වූ වැඩිදියුණුවීම් ඉතා සුළු හා මන්දගාමී විය.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල මගින් ද ශ්‍රී ලංකාව තුළ ළමා පෝෂණය සම්බන්ධයෙන් පහත දැක්වෙන වැදගත් නිරීක්ෂණ සිදු කර ඇත[9].

- පෝෂණ ඌනතාවය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැටලුවක් ව පවතී.
- ශ්‍රී ලංකාවේ ළමයින්ගේ වැඩීම වළක්වන අනුපාතය (අවුරුදු 5ට අඩු සියලු ළමුන්ගෙන් සියයට 13) ඇෆ්ගනිස්ථානය හා පකිස්ථානය වැනි කලාපයේ අනෙක් රටවලට වඩා අඩු අතර, චීනය, තායිලන්තය හා මැලේසියාව වැනි වෙනත් මැදි ආදායම් ලබන ආසියානු රටවලට වඩා ඉහළ මට්ටමක පවතී.
- 2009 සිට අඩු බර හා උසට සරිලන බරක් නොමැති වීම ඉහළ ගිය අතර දිස්ත්‍රික්ක 25න් 24 ක ම උසට සරිලන බරක් නොමැති වීම, (අවුරුදු 5 ට අඩු සියලු ළමුන්ගෙන් සියයට 15ට වඩා) බරපතළ කරුණක් ලෙස පෙනී ගොස් තිබේ.
- වැඩීම නතර වූ ළමුන්ගෙන් අඩක් පමණ සහ උසට සරිලන බරක් නොමැති ළමුන්ගෙන් සියයට 27ක්, වයස අවුරුදු දෙකට අඩු අය වෙති.
- ශ්‍රී ලංකාවේ අවුරුදු 5ට අඩු ළමුන්ගෙන් සියයට 2.3ක් පමණ (40,000) දරුණු මන්දපෝෂණයෙන් (Severe Acute Malnutrition - SAM) පෙළෙන අතර මිලියන හතරකට වඩා, විශේෂයෙන් ම කාන්තාවෝ හා ළමයි නීරක්තියෙන් පෙළෙති.
- ප්‍රාදේශීය ව සහ ආදායම් මට්ටම වැනි කරුණු මත මෙහි ව්‍යාප්තියෙහි සැලකිය යුතු විෂමතා පවතී.

ශ්‍රී ලංකාවේ ළමා පෝෂණ ඌනතා ගැටලුව, වියළි කලාපීය ප්‍රදේශවල විශේෂයෙන් ම උතුරු මැද පළාත, කිලිනොච්චිය හා මොණරාගල සහ මධ්‍යම කඳුකරයේ හා වතු ආශ්‍රිත දුප්පත් පවුල් ඒකකයන් තුළ ඒකරාශී වී ඇත. ධනවත් පවුල්වලට වඩා දුප්පත් පවුල් තුළ සහ රටේ අනෙක් ප්‍රදේශයන්ට වඩා වතු ආශ්‍රිත ව අඩු බර උපත් සහ ළමා පෝෂණ ඌනතාව පැතිරීම තුන් ගුණයකින් ඉහළ වේ.

ශ්‍රී ලංකාව පෝෂණ දර්ශකයන්ගෙන් අඩු ප්‍රගතියක් පෙන්වීමට ප්‍රධානතම හේතුන් වනුයේ දරිද්‍රතාව, ආහාර අනාරක්ෂිතතාව සහ එහි ප්‍රතිඵලයක් ලෙස මව්වරුන්ගේ දුර්වල සෞඛ්‍ය තත්ත්වය වේ. මේ අතරින් ශ්‍රී ලංකාව තුළ මේ සඳහා හේතු වන ප්‍රධානතම සාධකය වන්නේ, අඩු බර උපත්, ළමා වැඩීම නතර වීම හා අඩු බර

7 "ශ්‍රී ලංකාවේ ළමා පෝෂණ ඌනතාව පිළිබඳ අභියෝග" (ප්‍රකාශයට පත් නොවූ), පෝෂණ විශේෂඥ වෛද්‍ය - රේණුකා ජයතිස්ස, සෞඛ්‍ය අමාත්‍යාංශය, කොළඹ, ශ්‍රී ලංකාව, මත පදනම් වී ඇත.

8 "Preventable Hunger in Our Land of Plenty" ළමා ආරක්ෂණ අරමුදල, ඇ.එ.ජ.

9 "Nutrition, UNICEF, http(//www.unicef.org/srilanka/ Nutrition(1).pdf"

සඳහා තුනෙන් දෙකකට වඩා දායක වන, උපත් ආහාර අනාරක්ෂිතතාවයි. ආහාර අනාරක්ෂිතතාව, ආහාර පරිභෝජනයේ මදකම පමණක් නො ව සෞඛ්‍ය සම්පන්න සමබර ආහාර වේලක් ලබා ගැනීමට ඇති නො හැකියාව ද පිළිබිඹු කරයි.

දරිද්‍රතා මට්ටම්වලට සමගාමී ව ඉහළ යන අඩු බර උපත් හා වැඩීම නතර වීම සමග ශ්‍රී ලංකාව තුළ අඩු බර උපත් හා වැඩීම නතර වීම සඳහා දායක වන ප්‍රධාන ම සාධකය කුටුම්භ ආදායම ලෙස, 1993 සහ 2012 අතර අනුක්‍රමික ව සිදු කළ ජාතික සමීක්ෂණ විශ්ලේෂණ මගින් සොයා ගෙන ඇත. දරිද්‍රතාවෙන් පෙළෙන පවුල් බොහොමයකට ආහාර සපයා ගැනීමේ හැකියාව, පවුලේ සියලු සාමාජිකයන්ට පිළිගත් අවම ශක්ති අන්තර්ගතය ලබා ගැනීම තහවුරු කිරීමට කෙසේවත් ප්‍රමාණවත් නො වේ. ඒ අනුව, ශක්ති ඌනතාව ආදායම සමඟ සමීප සම්බන්ධතාවක් පවතී. දෛනික කුටුම්භ කැලරි ඌනතාව 2,000-3,500 අතර වෙමින්, ශක්ති ඌනතාවන්ට මුහුණදෙන ඉතා දරිද්‍රතාවෙන් යුතු කුටුම්භයන්ගේ ශක්ති පරිභෝජනය, ධනවත් කුටුම්භයන්ගේ ශක්ති පරිභෝජනයෙන් තුනෙන් දෙකකට සමාන වේ. දරිද්‍රතාවෙන් යුතු කුටුම්භයන් ඔවුන්ගේ මුළු ආදායම ම ආහාර සඳහා වැය කරන බව සැලකූ විට ද, ඔවුන්ට තනි ව ම මෙම පරතරය අවම කිරීමට හැකියාවක් නැත. හොඳ ම වෛද්‍ය තත්ත්ව යටතේ වුව ද, දරිද්‍රතාවෙන් යුත් පවුල්වල ළමුන් සාමාන්‍ය වර්ධන ප්‍රමාණයන්ට ළඟා වීම හෝ කැලරි ඌනතාවෙන් යුත් මව්වරුන්ට සාමාන්‍ය බරෙන් යුත් දරුවන් ප්‍රසූත කිරීම ජෛව විද්‍යාත්මක වුව ද අපේක්ෂා කළ නො හැකි වේ.

1990 දශකයේ සිට ශ්‍රී ලංකාව අත් කර ගත් ඒක පුද්ගල ආදායමට සාපේක්ෂ ව සියයට 5-6 අතර වූ වාර්ෂික වර්ධනය සාපේක්ෂ ව පෝෂණ ඌනතා දර්ශකයන්ගේ සුළු වර්ධනයක් දක්නට ලැබුණි. ආර්ථික වර්ධනයේ අසමාන බෙදීම මේ සඳහා ආංශික වශයෙන් දායක වේ. මෙම ඉහළ වර්ධනයෙන් ලද ප්‍රතිලාභ බොහොමයක් දිළිඳු නො වන අයට ලබා දෙමින් දරිද්‍රතාවෙන් යුතු වූවන්ට සුළු ප්‍රතිලාභ ප්‍රමාණයක් ගෙන දුණි. මෙය දරිද්‍රතාවෙන් පෙළෙන අයගේ ජීවන තත්ත්වයේ පවතින අඩුපාඩුවල ප්‍රතිඵලයක් වේ. ශ්‍රී ලාංකිකයන්ගෙන් සියයට 40ක් වූ දරිද්‍රතාවෙන් යුතු වූවන්ට ලැබෙන ආදායම් කොටස 1990 දී සියයට 21 සිට 2012/13 වසරේ දී සියයට 13.7 දක්වා පහළ යෑමට වර්ධන විෂමතා හේතු විය. මේ සමඟ, රජයේ සහනාධාර ඉලක්ක කිරීම දුර්වල මට්ටමක පැවතීම ශ්‍රී ලංකාවේ දුප්පත් ම ජනගහනයේ ආහාර සුරක්ෂිතාව කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන ලදී.

රට තුළ පෝෂණ ඌනතාව හා පාදක ප්‍රශ්නවල සමාජ-ආර්ථික වැදගත්කම හේතුවෙන් රජය මගින් දැනට සිදු කරගෙන යනු ලබන ප්‍රයත්නයන්ට අමතර ව, දරිද්‍රතාවෙන් යුතු වූවන් අතර පෝෂණ තත්ත්වයන් වැඩිදියුණු කිරීමට බහුවිධ ප්‍රවේශයෙන් යුතු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. ඵලදායී ජාතික උපායමාර්ගයක් මගින් අවදානමට ලක් වූ පවුල්වලට ඵලදායී හා ප්‍රමාණවත් ආහාර සැපයුම හා දේශීය නිෂ්පාදන ඉහළ දැමීමට හා විවිධාංගීකරණයට අවශ්‍ය කෘෂිකාර්මික උපායන්, සහ ඒ වැනි මූලික මැදිහත්වීම් සඳහා සහාය දීම, දැනුම් දීම සහ සැපයුම වැනි ක්ෂුද්‍ර මැදිහත්වීම් අන්තර්ගත විය යුතු ය. මෙම ගැටලුව නිරාකරණය කිරීමට පෝෂණ ක්ෂේත්‍රයේ සෞඛ්‍ය සේවකයන්ගේ ශක්‍යතාව ගොඩ නැංවීම සඳහා ප්‍රමාණවත් මූල්‍යයනයන් සැලසීම වැනි සෞඛ්‍ය නො වන මැදිහත්වීම් ද අත්‍යවශ්‍ය වේ. ඊට අමතර ව, පෝෂණ මට්ටම්වල විෂමතා පුළුල් වීම පිළිබිඹු කරනු ලබන, ළමුන් අතර අධිපෝෂණය ඉහළ යෑමේ කරුණු සලකා බලා, අනාගත පරපුර අතර දියවැඩියාව හා හෘද රෝග වැනි තත්ත්වයන්ගේ වර්ධනය වැළැක්වීමට කඩිනම් අවධානය යොමු කළ යුතු වේ.

### ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාව මැදිකාලීන ව ඉහළ ආර්ථික වර්ධනයක් ස්ථාවර ව පවත්වාගෙන යෑමට අපේක්ෂා කරන අතර එය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට අවස්ථාවන් ලබා දෙනු ඇත. කෙ සේ වෙතත්, ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් හේතුවෙන් පීඩාවට පත්විය හැකි ජනගහනය දරිද්‍රතාවෙන් නගා සිටුවීම සඳහා, ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභයන් “පහළට කාන්දු වීම” (Trickling Down) මත ප්‍රතිපත්ති සම්පාදකයන්ට සම්පූර්ණයෙන් විශ්වාසය තැබීමට නො හැකි වී ඇත. එ බැවින්, සර්ව සහභාගීත්ව වර්ධනය තුළින් සෞභාග්‍ය බෙදා ගැනීම සඳහා, රජය විසින් සමස්ත මහජනතාව ම වර්ධන ක්‍රියාදාම සඳහා දායක වීම පමණක් නො ව, එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට හැකි වන වර්ධන ක්‍රියාදාමයක් නිර්මාණය කර එය ශක්තිමත් ව හා අඛණ්ඩ ව පවත්වා ගෙන යෑම අත්‍යවශ්‍යයෙන් ම සිදු කළ යුතු ය.

(උපුටා ගැනීම: ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2015)

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ව්‍යවහාර මුදල් නෝට්ටු විකෘති කිරීම සහ හානි කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව ඔබ දන්නවාද




**සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් නෝට්ටු විශාල ප්‍රමාණයක් හිතාමතා විකෘති කර සහ/ හෝ හානි කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත.**

- ☐ ව්‍යවහාර මුදල් නෝට්ටු විකෘති කිරීම හෝ හානි කිරීම 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ වරදක් වන අතර සිරගත කිරීම හෝ දඩ මුදලකට යටත් කිරීම හෝ එම දඬුවම් දෙක ම ලබා දිය හැකි ය.
- ☐ මුදල් නීති පනත යටතේ පනවන ලද අදාළ රෙගුලාසිවල (Regulation E) අංක 10 පරිච්ඡේදය යටතේ සිතාමතා විකෘති කරන ලද මුදල් නෝට්ටු ශ්‍රී ලංකා මහ බැංකුව භාරයේ රඳවා තබා ගන්නා අතර කිසිදු ගෙවීමක් සිදු නො කරයි.
- ☐ මෙම ව්‍යවහාර මුදල් නෝට්ටු සන්තකයේ තබාගන්නන් හට එම මුදල් නෝට්ටුවල මුහුණත වටිනාකමට අදාළ අලාභය දැරීමට සිදු වනු ඇත.

**ජාතික ධනය ඉතිරි කර ගැනීම සඳහා ව්‍යවහාර මුදල් නෝට්ටු පරිස්සමින් සහ පිරිසිදු ව භාවිත කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් ඉල්ලා සිටියි.**

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, 30, ජනාධිපති මාවත, කොළඹ 1
+94 (0)112477726
currency@cbsl.lk
+94 (0)112477587

**ව්‍යවහාර මුදල් නෝට්ටුවක් මත ලිවීම, ඇඳීම, මුද්‍රා තැබීම, කැපීම හෝ හානි කිරීම වරදකි.**



## කාසි ඇත නිකරුණේ ඔබටමයි අලාභේ

රට තුළ භාවිතයට නො ගෙන නිකරුනේ තිබෙන කාසි සංඛ්‍යාව
අති විශාලයි.

මෙම කාසි සංසරණයට මුදා හැරීම තුළින් අලුතින් කාසි අච්චු ගැසීමට සාපේක්ෂ ව අප රටට විශාල මුදලක් ඉතිරි කර ගැනීමට පුළුවන්. කාසි අලුතින් අච්චු ගැසීමට දරන අධික වියදම ඔබට දිගුකාලීන පාඩුවක් අත්කර දීමට පුළුවන්.

ඒ නිසා ඔබ සතු ව නිකරුණේ පවතින කාසි සියල්ල ප්‍රයෝජනයට ගන්න.

රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, අංක 58 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදුව,
ශ්‍රී ලංකා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලදී.